මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) 11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/4/1/2 - 2020
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.09.24

**ජාතික අයවැය චක්‍රලේඛ අංක: 5/2019**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2019 වර්ෂයේ ඉතිරි කාලසීමාව තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම**

2019 අයවැය කථාවේ 212 ඡේදයට අනුව, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ වියදම් ඒකක යන සියලුම වියදම් කිරීමේ ආයතනයන් සමග සාකච්ඡා කර 2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් 15% ක් දැනටමත් ඉතිරි කර ඇත. මේ සඳහා, 2019.04.08 දිනැති අංක 03/2019 දරණ ජාතික අයවැය චක්‍රලේඛය නිකුත් කර ඇත.

02. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ඇති වූ අයහපත් ආර්ථික තත්ත්වය තුළ 2019 වර්ෂය සඳහා රජයේ අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වීම සහ රජයේ ණය ගැනීමේ වැඩසටහනේ ඇති සීමාවන් සැළකිල්ලට ගෙන, 2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් තවදුරටත් 10% ක් අනිවාර්යයෙන් ඉතිරි කර ගතයුතුව ඇත.

03. කරුණු මෙසේ හෙයින්, ප්‍රමුඛ නොවන ව්‍යාපෘතීන් හා මෙතෙක් ආරම්භ කර නොමැති අයවැය යෝජනා වල ඇතුලත් ව්‍යාපෘති සහ අත්‍යවශ්‍ය නොවන ගෘහ භාණ්ඩ, කාර්යාලයීය උපකරණ ආදී අයිතමයන් මිලදී ගැනීම් පිළිබඳව හඳුනාගැනීමටත් එම කාර්යයන් ඉදිරි වර්ෂය තෙක් කල්දැමීම කෙරෙහිත් අවධානය යොමු කරවනු ලැබේ. තවද, 2018.07.16 දිනැති අංක 03/2018 දරණ ජාතික අයවැය චක්‍රලේඛය යටතේ වාහන මිලදී ගැනීම නැවත දැනුම්දෙන තෙක් තාවකාලිකව අත්හිටවනු ලබන අතර, ප්‍රසම්පාදනය සඳහා එකඟතාවය ලද එහෙත් ගිවිසුම්ගතව නොමැති ප්‍රසම්පාදන කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීමද තාවකාලිකව අත්හිටුවනු ලැබේ.

04. එබැවින්, වර්ෂයේ ඉතිරි කාලසීමාව සඳහා මහා භාණ්ඩාගාරයට මුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනීමට හැකිවනු පිණිස සියලුම වියදම් කිරීමේ ආයතන විසින් 2019 වර්ෂයේ ඉතිරි මාස 03 ක කාලසීමාව (එනම් ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා) සඳහා වන වියදම් සැලසුම, භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ටද පිටපතක් සහිතව 2019 සැප්තැම්බර් මස 30 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවීමට අවශ්‍ය පියවර ගතයුතුය.

**අත්.කළේ / ආර්.එච්.එස්.සමරතුංග**
භාණ්ඩාගාර ලේකම්

පිටපත: විගණකාධිපති